# ප්‍රවෘත්ති නිවේදනය
## PRESS RELEASE
සෞඛ්‍ය අමාත්‍යාංශය | சுகாதார அமைச்சு | Ministry of Health

Telephone Office: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540


**2024.01.05**

| 01 | 07 |
|---|---|

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති කර්තෘ /ප්‍රවෘත්ති සංස්කාරක,

පහත සඳහන් ප්‍රවෘත්තිය ඔබ මාධ්‍ය ආයතනයේ පළ කරදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි .

---

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් පිටුව පරිශීලනය කර අවශ්‍ය විස්තර දැනගන්න, සිසු හෙද අයදුම්කරුවන් වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය දන්වයි......**

**සිසු හෙද පුහුණුවට තෝරා ගැනීමට මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ වලට අදාළ සියලු විස්තර මේවන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් පිටුවේ (https://www.health.gov.lk/) පළ කර ඇත .**

**මේ සඳහා අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන් එම වෙබ් පිටුව පරිශීලනය කර තමන් හට සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, ස්ථානය හා ඊට අදාළ සියලු විස්තර දැනගන්නා මෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය අයදුම්කරුවන් වෙත දන්වා සිටී.**

**2019/2020 අ.පො. ස උසස් පෙළ විද්‍යා සහ ගණිත අංශ විෂයධාරා වලින් සමත්වී සිසු හෙද පුහුණුව සඳහා අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන් 4000 කට අධික ප්‍රමාණයකගෙන් සිසු හෙද පුහුණුවට තෝරා ගැනීමට මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ මේ මස 13 දින සිට පෙබරවාරි මස 18 දින දක්වා පැවැත්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.**

(මෙම සම්මුඛ පරීක්ෂණ වලට අදාළ විස්තර දැන ගැනීම සඳහා දිනකට සෞඛ්‍ය අමාත්‍යාංශයට දුරකථන ඇමතුම් විශාල ප්‍රමාණයක් ලැබේ. එම අයදුම්කරුවන් දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවයක් සේ සලකා මෙම නිවේදනය ඔබ මාධ්‍ය ආයතනයේ ප්‍රචාරය කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.)


**චමින්ද කරුණාරත්න**
**සම්බන්ධීකරණ ලේකම් (මාධ්‍ය)**
**071174174**